# දෙමා-පියන් විදේශගත වූ දරුවන්ගේ සමාජ චර්යා පිළිබඳ අධ්‍යයනයක්

ගෝවින්නගේ නීල් අයිරා ලීලානන්ද

REFERENCE ONLY

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ
මානව හා සමාජ විද්‍යා පීඨයේ
අධ්‍යාපනපති උපාධි පරීක්ෂණයේ
කොටසක් සම්පූර්ණ කිරීම සඳහා
ඉදිරිපත් කරන ලද නිබන්ධනයකි

1996 පෙබරවාරි

OPEN UNIVERSITY
45529

45529

## සාරාංශය

හැත්තෑවේ දශකයේ අග භාගයේ සිට ඇරඹි විදේශ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයන් එතර යෑම අසූව දශකයේ අග භාගයේ සිට සීඝ්‍ර ලෙස වර්ධනය වීමට පටන් ගෙන ඇත. දැනට විදේශ රැකියාවන්හි නියුතු අය ලක්ෂ පහ ඉක්මවන අතර මේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් වැඩි වෙමින් පවතී. මේ හේතුව නිසා දෙ මා-පියන් දෙදෙනා ම හෝ එක් කෙනෙකු හෝ නොමැතිව වැඩෙන දරුවන්ගේ සංඛ්‍යාව ද සීඝ්‍රයෙන් ඉහළ යෑමට පටන් ගෙන ඇත.

විශාල වශයෙන් පුද්ගලයන් විදේශ රැකියාවලට යාමත් සමඟ ම ඒ හා සම්බන්ධ සමාජයීය ගැටළු ද වර්ධනය වන්නට විය. මේ අතර අඹු සැමියන් වෙන්වීම හේතුවෙන් පවුල්වල හටගන්නා ප්‍රශ්න ද දෙ මා-පියන් වෙන්වීම නිසා දරු දැරියන්ට ඇතිවන ප්‍රශ්න ද ප්‍රධාන තැනක් ගනී. එසේ දෙ මා-පියන්ගෙන් කෙනෙකු හෝ දෙදෙනාම හෝ නොමැතිව වැඩෙන දරුවන්ගේ සමාජ චර්යා පිළිබඳව විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ යි.

මහනුවර දිස්ත්‍රික්කයේ නාගරික පාසලකින් තෝරාගන්නා ලද ගැටවර වියේ සහ ඒ ආසන්න වයස් සීමාවල ළමුන් සියැදියක් මේ සඳහා යොදා ගැනිණ. ඔවුන් අතර බෙදා දෙන ලද ප්‍රශ්නාවලි මඟින් අධ්‍යයනය සඳහා අවශ්‍ය තොරතුරු ලබාගන්නා ලදී. පිළිගත් සංඛ්‍යාන ක්‍රම යොදා එම දත්ත විශ්ලේෂණය කර ඇත. එමඟින් දෙ මා-පියන් විදේශගත වූ ළමුන් තුළ පවතින සමාජ චර්යාවල පැහැදිලි වෙනසක් ඇති බවත් ආක්‍රමණශීලී බව, හුදකලා බව, කාංසාව සහ කුතුහලය වැනි අහිතකර චර්යා ඔවුන් අතර පවතින බවත් අනාවරණය වී ඇත.